**කොවිඩ් - 19 හදිසි ප්‍රතිචාර සහ සෞඛ්‍ය පද්ධති සූදානම් කිරීම සඳහා අතිරේක මූල්‍යනය ව්‍යාපෘතිය - 2022**

-----------------------------------------------------------------------------------------------------------------------

කොවිඩ් - 19 හදිසි ප්‍රතිචාර සහ සෞඛ්‍ය පද්ධති සූදානම් කිරීම සඳහා අතිරේක මූල්‍යනය ව්‍යාපෘතියේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ජාත්‍යන්තර සංවර්ධන සංගමය අතර 2020 ජුලි 23 දින එළඹි අංක 67270 -එල්කේ දරන මූල්‍ය ගිවිසුමේ V ව්‍යවස්ථාවේ 5.01 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළයුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාලය

ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව,එවකට කාන්තා සහ ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යාංශය, වර්තමානයේ සමෘද්ධි, ගෘහ ආර්ථිකය,ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා සහ ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාතයාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ සහ ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණ වසංගත කාලසීමාව තුළ පොරොත්තු ලේඛනයේ අයදුම්කරුවන් ඇතුළත් කිරීම සහ/හෝ පවතින මුදල් ලබාදීමේ වැඩසටහන් යටතේ වැඩි මුදලක් ලබා දීම මගින් ආබාධ සහිත වැඩිහිටි පුද්ගලයින් සහ නිදන්ගත රෝගාබාධ සහිත රෝගීන් සඳහා පවතින මුදල් ලබාදීමේ වැඩසටහන් හරහා මුදල් ලබාදීම වැඩිකිරීම වේ.මූල්‍ය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 7,803.87 කට සමාන වූ එජඩො මිලියන 41.09 ක මුදල ජාත්‍යන්තර සංවර්ධන සංගමය විසින් මූල්‍යයනය කිරීමට එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2020 ජුලි 23 දින ආරම්භ කර තිබුණු අතර, 2023 දෙසැම්බර් 31 දින වනවිට නිම කිරිමට සැලසුම් කර තිබුණි.

## 1.3 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.1 ඡේදයේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර,ව්‍යාපෘතියේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය, වියදම් ප්‍රකාශය හා එහි මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදුකරන ලදී. මෙම විගනන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හාසත්‍ය හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පරීක්ෂා කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍යප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍යප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවයමෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදීවෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති වියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී .වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුනු පිළිබඳවපාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| ගිණුම්කරණඅඩුපාඩුව/විගණන නිරීක්ෂණය | මුදල රු. | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| 2022 දෙසැම්බර් 31 දිනට ජාත්‍යන්තර සංවර්ධන සංගමයට අදාළ එජඩො ණය ශේෂය එම දිනයේ ශ්‍රී ලංකා රුපියල් අගයට පරිවර්තනය කර නොතිබූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය තත්ත්වය ප්‍රකාශනයේ දැක්වෙන ණය ශේෂය සහ සංවර්ධන වියදම් ශේෂය අවතක්සේරු කර තිබුණි. | මිලියන 8,779 | මෙම අමාත්‍යාංශයේ වගකීම වූයේ භාණ්ඩාගාරයේ පවත්වාගෙන යන ගිණුමට වියදම් ප්‍රතිපූරණය කිරීම සඳහා සුදුසුකම් ඇති වියදම් පිළිබඳ මුදල් ආපසු ගැනීමේ අයදුම්පත "සේවාලාභී සම්බන්ධතා" (වෙබ් පදනම් කරගත් ගෙවීම් | ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන් අනුගමනය කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | | යාන්ත්‍රණය) හරහා ලෝක බැංකුවට ඉදිරිපත් කිරීමයි. සමානාත්මතාවය ගැලපීම ගිණුම්ගත නොකිරීමට හේතු සෞඛ්‍ය අමාත්‍යාංශයේ සහ භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ ව්‍යාපෘති කාර්යාලයෙන් පැහැදිලි කළ යුතුය. | |

**2.2 නීතිරීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

| අංකය | නීතිරීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම / විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි අංක 626, | මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී ව්‍යාපෘතිය විසින් ගිණුම් පොත්, ලේඛන සහ ඊට අදාළ සාක්ෂි වෙනම තබා ගත යුතු නමුත් එසේ නොකිරීම හේතුවෙන් ඊට අදාළ ලේඛනගත සාක්ෂි විගණනයට ඉදිරිපත් කිරීමට නොහැකි විය. | මෙම අමාත්‍යාංශයේ 171-02-07-04-1501 වියදම් කේතය යටතේ මහා භාණ්ඩාගාරයෙන් ලැබුණු ප්‍රතිපාදන යොදා ගනිමින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් පොරොත්තු ලේඛනවල සිටින ප්‍රතිලාභීන්ට සහ නිත්‍ය ප්‍රතිලාභීන්ට වකුගඩු දීමනා සාමාන්‍ය ක්‍රමවේදයට අනුව ගෙවා ඇති බැවින්, මෙම ව්‍යාපෘතිවල ගිණුම් සඳහා වෙන වෙනම පොත් නඩත්තු කර නොමැත. ව්‍යාපෘතිය සම්බන්ධයෙන් අමාත්‍යාංශයේ වගකීම වූයේ, ලෝක බැංකුව විසින් අන්තර්ජාලය හරහා ක්‍රියාත්මක කරන ලද "සේවාදායක සම්බන්ධතා" ක්‍රමය හරහා හිමිකම් පාන්නන් සඳහා දරන ලද වියදම් ප්‍රතිපූරණය කිරීම සඳහා වන වියදම් පිළිබඳ අයදුම්පත් මහා භාණ්ඩාගාරය විසින් පවත්වාගෙන යනු ලබන ගිණුම් වෙත ඉදිරිපත් කිරීම පමණි. | මූල්‍ය රෙගුලාසි අනුගමනය කළ යුතු අතර අදාළ පොත්පත් සහ ලේඛන නඩත්තු කළ යුතුය. |
| (ආ) | (i) රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ අංක30/94 හා1994 අප්‍රේල් 20 දිනැති චක්‍රලේඛයේ 5.6.15 ඡේදය | ගණන්දීමේ නිලධාරීන්/ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් විසින් ප්‍රතිපූරණය කළ හැකි විදේශ ආධාර වැය අඩංගු වන්නා වූ ව්‍යාපෘති වල සමුච්චිත වියදම් සහ ලැබෙන ප්‍රතිපූර්ණ දැක්වෙන මාසික වාර්තාවක් පිළියෙල කර රාජ්‍ය ගිණුම් | ව්‍යාපෘතිය සම්බන්ධයෙන් අමාත්‍යාංශයේ වගකීම වූයේ, ලෝක බැංකුව විසින් අන්තර්ජාලය හරහා ක්‍රියාත්මක කරන ලද "සේවාදායක සම්බන්ධතා" ක්‍රමය හරහා, මහා භාණ්ඩාගාරය විසින් පවත්වාගෙන යනු ලබන ගිණුම් වෙත හිමිකම් | අදාළ චක්‍රලේඛ අනුගමනය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | අධ්‍යක්ෂ ජනරාල් වෙත යැවිය යුතු නමුත් සමාලෝචිත වර්ෂයේ එසේ සිදු කර නොතිබුණි. | පැම සඳහා වියදම් කරන ලද වියදම් ප්‍රතිපූරණය කිරීම සඳහා වියදම් අයදුම්පත් ඉදිරිපත් කිරීම පමණි. මෙහි සඳහන් මාසික වාර්තා සකස් කිරීම සෞඛ්‍ය අමාත්‍යාංශයේ / මහා භාණ්ඩාගාරයේ ව්‍යාපෘති කාර්යාලය මගින් සිදු කෙරේ. | |
| (ii)5.6.16 ඡේදය, | ගණන්දීමේ නිලධාරීන් සහ ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් විසින් ප්‍රතිපූරණය කළ හැකි විදේශ ආධාර යෙදවීම, වැය ඉල්ලීම සහ ප්‍රතිපූරණ ලැබීම් පිළිබඳව දැඩි ලෙස අධීක්ෂණය කළ යුතු නමුත් එසේ කර තිබූ බව නිරීක්ෂණය නොවීය. සමාලෝචිත වර්ෂය තුළ වියදම් කරන ලද අයදුම්පත් 2022 අප්‍රේල් 18 සහ ජූනි 01 යන දිනවල ඉදිරිපත් කර තිබුණු අතර 2021 ජූනි සිට දෙසැම්බර් දක්වා ව්‍යාපෘතිය විසින් වැය කරන ලද රු. මිලියන 415.47 ක් සඳහා වූ ප්‍රතිපූර්ණ ඉල්ලුම්පත් 2022 ජනවාරි 27 සහ මාර්තු 3 දින ඉදිරිපත් කර තිබූ බව නිරීක්ෂණය විය. | ව්‍යාපෘතිය සම්බන්ධයෙන් අමාත්‍යාංශයේ වගකීම වූයේ ලෝක බැංකුව විසින් අන්තර්ජාලය හරහා ක්‍රියාත්මක කරන ලද "සේවාදායක සම්බන්ධතා" ක්‍රමය හරහා හිමිකම් පාන්නන් සඳහා දරන ලද වියදම් ප්‍රතිපූරණය කිරීම සඳහා වන වියදම් සඳහා අයදුම්පත් මහා භාණ්ඩාගාරය විසින් පවත්වාගෙන යනු ලබන ගිණුම් වෙත ඉදිරිපත් කිරීම පමණි.<br>2021 ජූනි සිට දෙසැම්බර් දක්වා වියදම් කළ රුපියල් මිලියන 415.47 ක මුදලකට අදාළ ප්‍රතිපූරණ අයදුම්පත් 2022 ජනවාරි 27 සහ මාර්තු 03 යන දිනවල ඉදිරිපත් කළද, ඉදිරිපත් කිරීමට නියමිතව තිබුණේ2021 ජූනි සිට දෙසැම්බර් දක්වා කාලය තුළය. නමුත් කොවිඩ්-19 ව්‍යාප්තිය හේතුවෙන් ඇති වූ තත්ත්වයන් මතවාර්තා සැකසීම ප්‍රමාද වීම සිදුවිය. | අදාළ චක්‍රලේඛ අනුගමනය කළ යුතුය. |

**3.** **භෞතික කාර්යසාධනය**

**3.1** **මතභේදාත්මක ගනුදෙනු**

| **අංකය** | **විගණන නිරීක්ෂණය** | **කළමනාකරණයේ ප්‍රතිචාරය** | **විගණකගේ නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | 2022 ජනවාරි සිට අප්‍රේල් දක්වා මාස 4 ක කාලය තුළ දිස්ත්‍රික්ක 25 ක පොරොත්තු ලේඛනයේ සිටි වකුගඩු රෝගීන් සඳහා මෙම ව්‍යාපෘතිය මගින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා ලබාදී තිබූ රුපියල් රු.5000 කට අදාළ ලේඛන ගත සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | නිත්‍ය ප්‍රතිලාභීන්ට සහ පොරොත්තු ලේඛනවල සිටින ප්‍රතිලාභීන්ට ගෙවීම සඳහා ආබාධ සහිත තැනැත්තන් සඳහා වන ජාතික ලේකම් කාර්යාලය විසින් ඉදිරිපත් කරන ලද ලැයිස්තු මත පදනම්ව වාර්ෂික අයවැය මඟින් වෙන් කරන ලද ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත නිකුත් කරන ලදී. එම දීමනා සඳහා ගෙවීම් කිරීමෙන් පසු, භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව දිස්ත්‍රික් මට්ටමින් සාරාංශ වියදම් වාර්තා ගිණුම් අංශය විසින් සකස් කරන අතර එම දීමනාවට අදාළ ලියකියවිලි අමාත්‍යාංශය විසින් පවත්වාගෙන යනු ලැබේ. මෙම ව්‍යාපෘතිය සඳහා විදේශ මුදල් මේ අමාත්‍යාංශයට නොලැබීම නිසා විදේශ ගනුදෙනුවලට අදාළ ගිණුම් පවත්වාගෙන යාමක් සිදු නොකරන ලදී. | අදාල ලේඛන විගණනයට ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ ලෝක බැංකු කණ්ඩායම විසින් පවත්වන ලද අර්ධ වාර්ෂික සමාලෝචන රැස්වීම් වාර්තාවට අනුව, 2022 අප්‍රේල් මාසය දක්වා පොරොත්තු ලේඛනයේ සිටින වකුගඩු රෝගීන්ට සහන සැලසීමට 2020 සැප්තැම්බර් මාසයේදී කැබිනට් මණ්ඩලය තීරණය කර ඇති බව සඳහන් වුවද, එම අමාත්‍ය මණ්ඩල තීරණය විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.<br>නමුත් තෝරාගත් දිස්ත්‍රික්ක එකොළහක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අසූ දෙකක සිටිනවකුගඩු රෝගීන්ට මේ දීමනාව ලැබෙමින් තිබුණි. කෙසේනමුත් ඉහත දීමනාව 2020 වසර සඳහා පමණක් දිවයින පුරා සිටින වකුගඩු රෝගීන්ට ලබාදීමට කැබිනට් මණ්ඩලය තීරණය කර තිබුණි. | නිත්‍ය දීමනා ලේඛනයට ඇතුළත් නොවී පොරොත්තු ලේඛනයේ සිටි වකුගඩු රෝගීන් ඇතුළුව මුදල් ගෙවීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන භාණ්ඩාගාරයෙන් මුදල් ලබාගැනීමට අමාත්‍යාංශය අවශ්‍ය කටයුතු කර ඇත. (අමාත්‍ය මණ්ඩල සංදේශය සහ තීන්දුවේ පිටපත් ඇමුණුම් අංක 01 මගින් ඉදිරිපත් කර ඇත) ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව මුදල් ප්‍රතිපූරණය සම්බන්ධයෙන් කටයුතු කර ඇති බැවින් වැඩිදුර විස්තර සඳහා එම දෙපාර්තමේන්තුවෙන් විමසිය යුතුය. | අවසර ලත් වියදම් පමණක් දැරිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | පොරොත්තු ලේඛනයේ සිටින වකුගඩු රෝගීන් 13849ක් වෙනුවෙන් මාස 4කදී රුපියල් මිලියන 276.98ක් ගෙවා තිබුණද, නිවැරදි වකුගඩු රෝගීන්ට මෙම මුදල ගෙවා ඇත්ද යන්න තහවුරු කිරීමට අවශ්‍ය අභ්‍යන්තර පාලන පද්ධතියක් ක්‍රියාත්මක වූ බවට කිසිදු සාක්ෂියක් විගණනයට ඉදිරිපත් නොවීය. | සමාජ සේවා අමාත්‍යාංශයේ චක්‍රලේඛ අංක 1/2025 යටතේ වකුගඩු දීමනා සඳහා ප්‍රතිලාභීන් තෝරා ගැනීමේ ක්‍රියාවලියේදී වකුගඩු රෝගීන්ගේ අයදුම්පත්, වෛද්‍ය වාර්තා, ග්‍රාම නිලධාරීවරයා අඩු ආදායම්ලාභී පවුලේ සාමාජිකයෙකු ලෙස නිර්දේශ කිරීම සහ සමාජ සේවා නිලධාරියාගේ නිර්දේශය සලකා බලා දීමනා සඳහා ප්‍රාදේශීය ලේකම් අනුමැතිය ලබා දෙයි. ඔවුන්ගේ තොරතුරු (මාරුවීම්, මරණ ආදිය) ද සමාජ සේවා නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් යාවත්කාලීන කෙරේ. එබැවින් රෝගීන්ගේ අයදුම්පත්‍ර, වෛද්‍ය වාර්තා ආදී සියලුම වාර්තා අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් පවත්වාගෙන යනු ලැබේ. ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් ඉදිරිපත් කරන ලද ප්‍රතිලාභීන් සංඛ්‍යාව අනුව ආබාධ සහිත තැනැත්තන් පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය දිස්ත්‍රික් ලේකම් කාර්යාල සඳහා ප්‍රතිපාදන ලබාදීමට ලැයිස්තු සකස් කරන අතර එම ලේකම් කාර්යාලයේ නිර්දේශය මත මෙම අමාත්‍යාංශයේ ගිණුම් අංශය දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත ප්‍රතිපාදන නිකුත් කරයි. | ගෙවීම්වල නිවැරදි බව තහවුරු කිරීමට අවශ්‍ය සියලුම සාක්ෂි විගණනයට ඉදිරිපත් කළ යුතුය. |